Ostwald, Martin. 1996. **Shares and Rights: 'Citizenship' Greek style and American style**. In *Demokratia: a conversation on democracies, ancient and modern* edited by Josiah Ober; Charles W Hedrick. 56-57. Princeton.

Ste. Croix, G. E. M. de. 2004. **Athenian Democratic Origins and Other Essays**. Edited by David Harvey and Robert Parker. Oxford.

Wallace, Robert W. 2007 **Revolution and a New Order in Solonian Athens and Archaic Grecce**. In *Origins of Democracy in Ancient Greece* edited by Kurt A. Raaflaub, Josiah Ober, and Robert W. Wallace. California.


# කතෝලික හා ක්‍රිස්තියානි ආගමික ග්‍රන්ථකරුවන් ආගම ප්‍රචාරණයෙහිලා සිංහල කටවහර භාවිතයට ගත් ආකාරය

නීල් පුෂ්පකුමාර

Literature in Sinhala has been influenced by Buddhist principles since its inception. However, due to the political and sociocultural changes that took place in the 16th century, Sinhala was employed to express views of other religions as well. The arrival of the Portuguese and Dutch colonists who introduced Catholicism and other denominations of Christianity marked a significant moment in Sinhala literature when Sinhala began to be used to express different sociocultural experiences and points of view arising from these religious influences. This research study focuses on the use of vernacular Sinhala among different authors and translators of religious texts. It attempts to identify their influences and to evaluate the influence on Sinhala literature in the writing of Fr Joseph Vaz, Father Jacome Gonsalves and in the translations of the Bible published in 1813, 1827, and 1846.

## ප්‍රවේශය

ලෝකයේ කිසියම් වූ සාහිත්‍ය කෘතියක් ස්වාධීන ව පහළ විය නොහැකි ය. සාහිත්‍ය කෘතියක් තත් යුගයේ සමාජ, ආර්ථික, සංස්කෘතික, ඓතිහාසික ආදි බලවේගයක් පදනම් කරගෙන බිහිවෙයි. එහෙයින් කිසියම් සාහිත්‍යාංගයක ප්‍රභවය, ප්‍රවර්ධනය මෙන්ම පරිහානිය කෙරෙහිද මූලික වශයෙන් බලපානුයේ තත් යුගයේ සමාජාර්ථිකාදි සංස්ථාවන්හි සිදුවන විචල්‍යයන්ය.[1] ක්‍රි. පූ. 03 වන සියවසේ පටන් මෙරට සමාජාර්ථික, සංස්කෘතිකාදි සියලු

© කථිකාචාර්ය නීල් පුෂ්පකුමාර

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 23 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

ක්ෂේත්‍රයන්හි පදනම සැකසීමෙහිලා මූලික වූයේ බුදුදහමයි. අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගයේ අවසානය දක්වා වැඩීගෙන ආ සිංහල සාහිත්‍යයේ ලෝක දෘෂ්ටිය මුළුමනින් ම පාහේ බෞද්ධාගමික පරමාර්ථ වටා කේන්ද්‍රගතව පැවතුණි.

"පෙදෙන් බුදු සිරිතැ
බසින් වත් සිරිත් ඈ
පද යුතු බසින් නළු ඈ
අනතුරු ලකුණු දක්වම්"[2]

සියබස්ලකරෙහි උක්ත පද්‍යයෙන් දැක්වෙන ආකාරයට බුද්ධ චරිතාදිය පද්‍යයෙන් වර්ණනා කළ යුතු ය. ව්‍රත, චාරිත්‍රාදිය ගද්‍යයෙන් වර්ණනා කළ යුතුය. නාටකාදිය පද්‍යයුක්ත වාක්‍යයෙන් හෙවත් චම්පුවෙන් වර්ණනා කළ යුතු ය. සියබස්ලකරේ එන මෙම න්‍යාය ගුරු තන්හිලා සැලකූ ලාංකේය ජේක ජනයෝ තදන්‍ය වෛෂයික නිර්මාණ විෂයයෙහි ස්වීය චින්තන ශක්තිය නොමෙහෙය වූහ. එහෙයින් ආරම්භයේ සිට කෝට්ටේ යුගය අවසානය වන තුරු සිංහල සාහිත්‍යය බොහෝ සෙයින් ඒක කේන්ද්‍රීය විය.

එසේ වුවද, සොළොස් වන සියවසෙහි සිදු වූ සමාජ, සංස්කෘතකාදි විචලනයන්හි ප්‍රතිඵල වශයෙන් එතෙක් විෂයය නොවූත්, ආගන්තුක වූත් ආගමික දෘෂ්ටියකට අනුරූපී අදහස් ප්‍රකාශ කිරීමට සිංහල භාෂාව යොදා ගනු පෙනේ. දහසය වන සියවසයෙහි සිදු වූ පෘතුගීසීන්ගේ ආගමනය හා ඔවුන්ගේ අනුයායින් වශයෙන් පැමිණි ලංදේසීන්ද විසින් බෞද්ධාගමික පරමාර්ථවලින් අන්‍ය වූ සාහිත්‍යයක් සිංහලයෙන් ඉදිරිපත් කිරීම හේතුවෙන් සිංහල සාහිත්‍යයේ මුහුණුවර පැහැදිලි වෙනසකට භාජනය විය. යුරෝපීය ජාතීන් හා ඔවුන්ගේ අනුගාමිකයන් වූ සිංහලයන් කතෝලික හා ක්‍රිස්තියානි ආදි නිකායන්හි මූලිකාංගාවබෝධය, අන්‍ය ලබ්ධීන් හා ලබ්ධිකයන් විවේචනය, ආගමික ප්‍රචාරණය හා රාජ්‍ය පාලනය, භාෂෝද්ග්‍රහණය[3] ආදි අරමුණු මූලික කර ගනිමින් ග්‍රන්ථ සම්පාදනයෙහිලා උත්සුක වීමේ ප්‍රතිඵල වශයෙන් සිංහල කතෝලික හා ක්‍රිස්තියානි සාහිත්‍යයක් බිහි විය. යථෝක්ත සාහිත්‍යයන්හි පරමාර්ථ අතර ආගමික ප්‍රචාරණය ප්‍රමුඛස්ථානයක් ඉසිලූ වගට සාධක බහුල ය.



ක්‍රි. ව. 1505දී පෘතුගීසීන්ගේ ලංකාගමනයත් සමග ලාංකේය සමාජයෙහි කිතු සමය ව්‍යාප්ත වන්නට විය. ලක්දිව ක්‍රිස්තු ධර්මය ව්‍යාප්තිය සඳහා ක්‍රමානුකූල සංවිධානයක් පළමුව ආරම්භ වූයේ දහසය වන සියවසේ මධ්‍ය භාගයේය. ෆ්‍රැන්සිස්කන් තපසුන් විසින්ද, ඉන්පසුව ජේසු නිකායික පියවරුන් විසින්ද ආරබ්ධ මෙම ව්‍යාපාරයට ඔගස්ටිනියන් හා දොමිනිකන් පංතිවල තාපසයෝද එක් වූහ.[4] ඔවුනගේ ප්‍රධාන අරමුණ වූයේ සැදැහැවතුන්ට ක්‍රිස්තු ධර්මයේ මූලික සත්‍යයන් අවබෝධ කරවීම සඳහා දහම් පොත් රචනය හා ස්වකීය අධ්‍යයනය සඳහා ව්‍යාකරණ හා ශබ්දකෝෂ රචනා කිරීමයි. එසේ වුවද, සොළොස්වන හා සතළොස්වන සියවස්හි කතෝලික ධර්ම දූතයන් විසින් හෙළ බසින් රචිත එකදු කෘතියක් හෝ මේ වනවිට අවිද්‍යමාන ය.[5]

සිංහල කතෝලික ආගමික ප්‍රචාරණ ග්‍රන්ථ පිළිබඳ විමසා බැලීමේ දී දාහත් වන සියවසේ අග භාගයෙහි මෙරටට පැමිණි ඉන්දියානු ජාතික කතෝලික පූජකයකු වූ ජුසේ වාස් (Joseph Vaz) පියතුමාට හා දහ අට වන සියවසේ මුල දී මෙරටට පැමිණි ඉන්දියානු බ්‍රාහ්මණ සම්භවයක් සහිත කතෝලික පූජකයකු වූ ජාකෝමේ ගොන්සාල්වේස් (Jacome Goncalvez) පියතුමාට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. දාහත් වන සියවසේ අගභාගයේ පමණ ලංකාවට පැමිණි ජුසේ වාස් පියතුමා ආගමික ප්‍රචාරණය පමණක් නොව කතෝලික සිංහල සාහිත්‍යයේද පුරෝගාමියෙකි. එතුමාගේ බොහෝ කෘති පරිවර්තන සාහිත්‍යට සම්බන්ධය. ප්‍රධාන යාඥාවල් සිංහලයට පෙරළීම එක් කරුණකි. එම ග්‍රන්ථ නමස්කාර නම්. එවැනි නමස්කාර 7කි. තවද, ධර්මෝපදේශ දානය මූලික කරගත් **දේවමාතා ප්‍රාර්ථනා** නම් ග්‍රන්ථ සම්ප්‍රදායක්ද, **ජපමාලා** හා **පාදනමස්කාර** නම් ග්‍රන්ථ සම්ප්‍රදායක්ද ආරම්භ කළේ ය.

ජුසේ වාස් පියතුමාගෙන් පසු කතෝලික ආගම් ප්‍රචාරණයෙහි මෙන්ම සිංහල සාහිත්‍ය විෂයයෙහිද අසහාය නියමුවා වූයේ 1705දී මෙරටට පැමිණි ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාය. මෙතුමා සිංහල, දෙමළ, පෘතුගීසී, ලන්දේසි භාෂාවලින්ද ආගමික ග්‍රන්ථ රචනා කළේය. එම ග්‍රන්ථ පහත පරිදි වර්ගීකරණය කළ හැකි ය.

1. සිංහල පොත් 22යි.
2. දෙමළ පොත් 15යි.
3. පෘතුගීසි පොත් 4යි.
4. ලන්දේසි පොත් 1යි.[6]

මෙම ග්‍රන්ථයන් සියල්ල ඍජුව ම ආගමික ප්‍රචාරණ පරමාර්ථයෙන්ම රචනා නොවූයේ වුවද, කතෝලික ආගම් ප්‍රචාරණය එම ග්‍රන්ථයන්හි මුඛ්‍ය පරමාර්ථයක් වූ හෙයින් ආගමික ග්‍රන්ථ සේ හැඳින්වීම යුක්ති යුක්ත සේ හැඟේ. මෙම අරමුණ පෙරදැරි කරගෙන ගොන්සාල්වේස් පිඩිතුමා විසින් රචිත කෘති වශයෙන් **දේවවේද පුරාණය, දේවවේද සංක්ෂේපය, සුවිශේෂ විසාධනය, දේවනීති, ප්‍රාතිහාර්‍යාවලිය, වේද කාව්‍යය, දුක්ප්‍රාප්ති ප්‍රසංගය, පසන් පොත, අඥාන ඖෂධය, මාතර ප්‍රත්‍යක්ෂය, බුද්ධබණ ප්‍රත්‍යක්ෂය, මංගල ගීතය, සුකෘත දර්පණය, ක්‍රිස්තියානි පල්ලිය, ආත්ම රක්ෂණය** ආදිය දැක්විය හැකි ය.[7] කතෝලික ආගම ප්‍රචාරණය උදෙසා සිංහල ග්‍රන්ථ රචනා කළ ප්‍රමුඛයන් වශයෙන් කතෝලික සිංහල සාහිත්‍යයෙහි ගණන් ගැනෙනුයේ මෙම පූජකවරු දෙදෙනා ය.

තදනන්තරව අප ප්‍රස්තුතානුකූලව අපගේ අවධානය යොමු කළ යුතු වන්නේ ක්‍රිස්තියානි ආගමික ප්‍රචාරණ පරමාර්ථයෙන් රචිත ග්‍රන්ථ කෙරෙහිය. බුදුදහම ලාංකේය සාහිත්‍යාම්භරයෙහි නානාංගයන්ගෙන් සුපෝෂිත සාහිත්‍යයක් බිහි කළ අයුරින් ක්‍රිස්තියානි ආගමෙහි බලපෑමෙන් ක්‍රිස්තියානි ආගමික ග්‍රන්ථ වංශයෙක් බිහි වූ බව දැක්විය හැකිය. නූතන ක්‍රිස්තියානි සාහිත්‍යයට පදනම සැකසූ අයුරු ''ලක්දිව පෘතුගීසි පූජකයන් දේශ භාෂාවලින් ග්‍රන්ථකරණයෙහි යෙදීමට වැඩිරුචියක් දැක්වූ අතර, ආදි ම ක්‍රිස්තියානි සිංහල ලේඛකයන් සේ හැඳින්විය හැකි කොළඹ ශුද්ධ වූ පාවුළුගේ විද්‍යාලයේ ජේසුයිට් නිකායික පූජකයන් හා ඉතාලි ජාතික කතෝලික ධර්ම දූතයෙකු වූ මත්ථෙවුස් පෙලිංගොට්ටි විසින් ලියැවුණු ධර්මෝපදේශ, ශුද්ධවන්ත චරිතාපදාන, යාඥා හා කාව්‍ය ප්‍රබන්ධ (Canticles) නූතන සිංහල ක්‍රිස්තියානි සාහිත්‍යයේ ආරම්භයට මඟ පෑදූ නමාවශිෂ්ට ලේඛන සේ සැලකීමට පුළුවන''[8] යනුවෙන් රත්නසිරි අරංගල දක්වන සඳහනින් පැහැදිලි වේ. අවිනෂ්ට ආදි ම ක්‍රිස්තියානි සිංහල සාහිත්‍යය ග්‍රන්ථය ලෙස බොහෝ දෙනාගේ පිළිගැනීමට ලක් වන්නේ



'කුස්තන්සීනු හටන' වුවද, එය ක්‍රිස්තියානි ආගම් ප්‍රචාරක ග්‍රන්ථයක් වශයෙන් හැඳින්විය නොහැකිය. මෙය සිංහල ක්‍රිස්තියානි සාහිත්‍යයේ ආරම්භය ලෙස හෝ සිංහල කාව්‍ය රචනා නීති හා පැහැදිලි ක්‍රිස්තියානි සංදර්භයක මනා සංකලනයක් ලෙස හෝ හැඳින්වීම ප්‍රඥාගෝචර නොවන බව කිවයුත්තේ එය සංදේශ හා ප්‍රශස්ති කාව්‍ය සම්ප්‍රදාය පිළිබඳ අවබෝධයක් හා එම රචනා ක්‍රමයන්හි පරිචයක්ද සහිත රචකයකු සංස්කෘතීන් දෙකක් නියෝජනය කරන නායකයකු හා ප්‍රතිනායකයකු ඔවුන්ගේ විශ්වාස මත පිහිටා වර්ණනා කිරීමක් පමණක් සේ හැඳින්විය හැකි බැවිනි.[9] තවද, ක්‍රිස්තියානි ආගම් ප්‍රචාරක ග්‍රන්ථ පිළිබඳ සාධක ක්‍රිස්තු වර්ෂ දාහත් වන සියවසයේ පූර්වාර්ධයේදී පමණ හමු වේ. ජේසුයිට් මිෂනාරීන්ගේ ධර්මෝපදේශ ග්‍රන්ථය ක්‍රි. ව. 1546දීද, මත්ථෙවුස් පෙලිංගොට්ටි මිෂනාරිවරයාගේ ග්‍රන්ථ වර්ෂ 1610-1612 අතරේදීද රචනා වූ බවට සාධක පවතී. 1678දී දිවයිනට පැමිණි සයිමන් කට්, හා යොහැන්නස් රුඑල් නම් ලන්දේසි ධර්මදූතයන් ඉතා කෙටි කලෙකින් සිංහල භාෂාව පිළිබඳ මනා පරිචයක් ලැබ ධර්ම ග්‍රන්ථ පරිවර්තනයේද, භාෂාධ්‍යයන ග්‍රන්ථ සම්පාදනයේද නිරත වූහ.[10] එසේම, මුල් කාලීන ක්‍රිස්තියානි ව්‍යාපාරයත් සමග බොහෝ ග්‍රන්ථ රචනා වන්නට ඇතැයි සැලකිය හැකි වුවද, අවිනිෂ්ට සාධක හමුවනුයේ දාහත් වන හා දහ අට වන සියවස්වල සිටයි. මුල් කාලීනව ක්‍රිස්තියානි ආගම ප්‍රචාරණ සඳහා සම්පාදිත කෘති මුද්‍රණද්වාරයෙන් පිට නොවූ අතර අත්පිටපත් වශයෙන් පැවතියේය. ඒ අනුව, 1681ට පෙර ස්වාමීන් වහන්සේගේ යාඥාව, විශ්වාස ලක්ෂණය, දස පනත, කථෝපකථන, ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය, ලෙඩුන් සැනසීම ආදි කෘති රාශියක් අත් පිටපත් වශයෙන් සිංහලයට පරිවර්තනය වී ඇත.[11] එහෙත් අත් පිටපත් වශයෙන් පැවතීමේදී ආගම් ප්‍රචාරණ දුෂ්කර වීම ආදි බාධා හේතුවෙන් එවකට ආණ්ඩුකාරවරයා වූ ජාකොබ් ක්‍රිස්වියන් පිලාට් මුද්‍රණාලයක් ආරම්භ කිරීමත් සමග ග්‍රන්ථ රාශියක් රචනා වූ අතර **විශ්වාස ප්‍රකාශන, ක්‍රිස්තු ධර්ම සංග්‍රහය, දසපනත**[12] ආදි කුඩා ග්‍රන්ථ හා වාර ප්‍රකාශන අවිනෂ්ට සාධක සේ දැක්විය හැකි ය.

තවද, ජේම්ස් චාටර් (James Charter), විලියම් ටොල්ෆ්‍රි (William Tolfrey), බෙන්ජමින් කල්ෆ් (Benjamin Clough), ඇස්. ලැම්බ්‍රික් (Samuel Lambrick), ආර්.ඇස්. හාර්ඩි (R.S. Hardy) වැනි

විදේශීය පූජකයන්ගේ ග්‍රන්ථ බැප්ටිස්ට් මිෂනාරි සමාගම, වෙස්ලියන් මිෂනාරි සමාගම, චර්ච් මිෂනාරි සමාගම, කොළඹ උපකාර බයිබල් සමාගම, කොළඹ උපකාරී ආගමික පුස්තිකා සංගමය, නුවර පත්‍රිකා බෙදා හැරීමේ සංගමය[13] වැනි මුද්‍රණාල මගින් මුද්‍රණද්වාරයෙන් එළි දක්වන්නට වීම ලාංකේය ක්‍රිස්තියානි ආගමික ප්‍රචාරණ ග්‍රන්ථකරණයේ ඉමහත් අභිවෘද්ධියට හේතු විය. උක්ත ආයතන මගින් ප්‍රකාශිත ක්‍රිස්තියානි ආගමික ප්‍රචාරක මාධ්‍ය ග්‍රන්ථ ප්‍රධාන වශයෙන් පහත පරිදි වර්ග කළ හැකි ය.

1. බයිබල් පරිවර්තන
2. පුවත්පත් හා වාර ප්‍රකාශන
3. පද්‍ය රචනා
4. නාඩගම් පිටපත්
5. බැති ගී, සින්දු හා පසම්

ක්‍රිස්තියානි ආගම ලාංකේය සමාජය තුළ ප්‍රචලිත කිරීමෙහිලා ක්‍රිස්තියානි පූජකවරුන් හා පාලකයන් ප්‍රධාන වශයෙන් යොදාගත් මාධ්‍ය වූයේ ශුද්ධ වූ බයිබලය සිංහලයට පරිවර්තනය කිරීමයි. එහිදී තත් පරිවර්තනයන්හි වූ භාෂා වෛෂයික ගැටලු ආදි කරුණු හේතුවෙන් එය ජනයාගේ සුබාවබෝධය උදෙසා විවිධ පුද්ගලයන් විසින් විවිධ අවස්ථාවන්හි සිංහලයට පෙරළීමෙන් එහි මුද්‍රණ කිහිපයක්ම බිහිවිය.

එසේ ම 17-20 සියවස් අතර මුද්‍රණ කර්මාන්ත ඇරඹීමත් සමග **මාසික තෑග්ග, ලංකා නිධානය, උරගල, විවේචනය, ශාස්ත්‍රාලංකාරය, ශාස්ත්‍ර නිධානය, සුධර්ම ප්‍රකරණය, රිවි කිරණ, ඥානෝදය, සත්‍යාලංකාරය, සත්‍යාලෝකය** වැනි පුවත්පත් සඟරා හා වාර ප්‍රකාශන සිය දහස් ගණනින් බිහි විය. ඒවා ක්‍රිස්තියානි ආගම ප්‍රචාරණයෙහිලා දැක්වූ දායකත්වය අතිමහත් ය. මේ හැරුණු විට පද්‍ය රචනා, නාඩගම් පිටපත්, බැති ගී, සින්දු හා පසම් වැනි ක්ෂේත්‍රයන් හරහාද ක්‍රිස්තියානි ආගමික ප්‍රචාරණ ව්‍යාපාරය බොහෝ සෙයින් සක්‍රීය විය.

සිංහල බෞද්ධ සමාජය තුළ කතෝලික හා ක්‍රිස්තියානි ආගම් ප්‍රචාරණයෙහිලා තත් ආගමික ප්‍රචාරකයින් විසින් ස්වකීය ප්‍රචාරක ග්‍රන්ථයන්හි උපයුක්ත භාෂාව විශේෂ ලක්ෂණ සහිත වූවකි. ඒ අතර කටවර භාවිත කිරීම සුවිශේෂී කරුණකි.



## සාකච්ඡාව

කතෝලික හා ක්‍රිස්තියානි සාහිත්‍ය වූ කලී වසර දහසකට ආසන්න කාලයක් පුරාවට සිංහල සාහිත්‍යයට පසුබිම් වූ සාමාජික හා සංස්කෘතික පසුතලයන් වෙනස් වූ අත්දැකීම් සම්භාරයක් ප්‍රකාශ කරනු වස් සිංහලය යොදාගත් මූලාවස්ථාව නියෝජනය කරයි. තවද, යථෝක්ත සාහිත්‍යයන් මගින් අප සාහිත්‍යයට පිවිසුණේ සිංහල රීතියට නුහුරු අදහස් සමූහයකි. එහෙයින් සිංහල සාහිත්‍යාගත සංකල්ප හා තදීය වාක් කෝෂය සිංහලය හා දීර්ඝ කාලීන ආගමික, දාර්ශනික, ආධ්‍යාපනික සම්බන්ධතා හා අඛණ්ඩ සංස්පර්ශයක් පැවැත් වූ එකම අනුශාබාවක භාෂා වන පාලි හා සංස්කෘත භාෂාවන්ගෙන් ලබා ගැණුනු අතර, බයිබල් පරිවර්තන ප්‍රධාන යථෝක්ත සාහිත්‍යයන් හේතුවෙන් සිංහලය හා බුද්ධි වෛෂයික සම්බන්ධයක් හෝ දීර්ඝ කාලීන සංස්පර්ශයක් නොමැති භාෂා කිහිපයකින් ගත් සංකල්ප හා වාක් කෝෂයක් සිංහල භාෂා පරිස්ථිතියෙහි ඉදිරිපත් විය.[14]

ක්‍රි. ව. දහසය වන සියවසයේ සිට සිංහල භාෂා ශාස්ත්‍රාදියෙහි අඳුරු යුගයක් සනිටුහන් වෙයි. භාෂා ශාස්ත්‍රඥානයෙන් සුපෝෂිත උගතුන් විරල වීම හා නොයෙක් හේතුන් කරණ කොට ගෙන ග්‍රන්ථකරණය අඩාලවීම වැනි කරුණු තත් යුගයේ භාෂා පරිහානියට හේතු විය. තවද, මෙකල පහළ වූ ගත්කතුවරු පැරණි භාෂා ව්‍යවහාරය පිළිබඳ නිරවුල් අවබෝධයෙන් තොරවූහ. දඹදෙණි අවධියේ ආරම්භයේ සිට අඩු වශයෙන්ද, කෝට්ටේ යුගයේ අවසානයත් සමග වැඩි වශයෙන්ද ලිඛිත බසත්, කථිත බසත් අතර පරතරය අඩුවන්නට විය. එහෙයින් ම තත් යුගයේ ලේඛකයෝ උචිතානුචිතතාව විමසීමෙන් තොරව කථිත හා ලිඛිත භාෂා මිශ්‍ර කරන්නට වූහ.[15] එහි ප්‍රතිඵලය වශයෙන් දහසය වන සියවසේ ආරම්භයේ සිට දහනව වන සියවස අවසානය දක්වා කිසියම් නීතිරීතියකින් තොර වූ අක්‍රමවත් ලිඛිත ගද්‍ය භාෂාවක් භාවිත විය. මෙම ලක්ෂණය මහනුවර යුගයේ භාෂා පුනර්ජීවයකට මංපෙත් හෙළිපෙහෙළි කළ වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ හිමිගේ කෘතිවල හා තත් යුගයේ පසුකාලීන ලේඛකයන්ගේ කෘතිවලද දක්නට ලැබේ.

කතෝලික හා ක්‍රිස්තියානි ධර්ම ප්‍රචාරණ ග්‍රන්ථ ප්‍රමුඛ තත් සාහිත්‍යයන් ප්‍රභවය වන්නේද මෙවැනි පසුබිමක ය. තත් ආගමික ග්‍රන්ථයන්හි කටවහර ලේඛනය විෂයෙහිද යොදා ගැනීමට මූලික වූ හේතුවක් වන්නේ සමකාලීන භාෂා පරිහාණියයි. එමෙන් ම සාම්ප්‍රදායික බෞද්ධ සංස්කෘතියට අනුගත වූ ජනයා වෙත සමීප වීමෙහි පහසු මාර්ගයක් වශයෙන්ද එය දැක්වීම සාවද්‍ය නොවේ. තව ද, කතෝලික හා ක්‍රිස්තියානි ආගම ප්‍රචාරණ පරමාර්ථයෙන් ග්‍රන්ථ සම්පාදනය කළ සම්පාදකයනට සම්භාව්‍ය සිංහල භාෂාව පිළිබඳ වූ අල්පාවබෝධය හා එය ලබාගැනීමේ මාර්ගයක් නොවීම යන කරුණුද උක්ත ග්‍රන්ථයන්හි භාෂා ස්වරූපය සැකසීමෙහිලා බල පෑ බව දැක්විය හැකි ය. එහෙයින් ආගම ප්‍රචාරණයෙහිලා සිංහල කටවහර භාවිතයට ගත් ආකාරය කතෝලික හා ක්‍රිස්තියානි ආගමික ග්‍රන්ථාශ්‍රයෙන් කෙරෙන විමර්ශනයෙහි පහසුව පිණිස පහත කරුණු යටතේ එය විමර්ශනය කිරීම යුක්තියුක්ත සේ හඟිමු.

1. කටවහරේ පමණක් හමුවන වචන භාවිතය
2. වර්තමාන කතාව්‍යවහාරයේ අවිද්‍යමාන තත්කාලීන ව්‍යවහාරාගත වචන භාවිතය
3. පද විකෘතිතා
4. උක්තාඛ්‍යාත යෝජනය
5. ප්‍රත්‍යයයෝජනය

### 1. කටවහරේ පමණක් හමුවන වචන භාවිතය

ආගම ප්‍රචාරය කිරීමේ පරමාර්ථයෙන් විරචිත කතෝලික හා ක්‍රිස්තියානි ග්‍රන්ථයන්හි කටවහර භාවිත කිරීම මුඛ්‍යතම ලක්ෂණයයි. ආගමික ව්‍යාප්තිය ශීඝ්‍ර කරලනු වස් කටවහරෙහි පමණක් හමුවන වදන්ද තම කෘතීන්හි යෝජනයට එම ග්‍රන්ථ කර්තෘන් උත්සාහ කළ බව ගොන්සාල්වේස් පියතුමන්ගේ ග්‍රන්ථාගත පහත නිදසුන්වලින් පැහැදිලි වේ.

> ''මම **නහින්ටත්** නුඹ ජීවත්ව සිටින්ටත් පිතා වන දෙවියන්ගේ පණිවිඩය පණත වී තිබෙනවා ය.''[16]
> ''...ගොඩගන්ට...''[17]
> ''...රිදී තිහක් **දෙඤ්ඤමුව**''[18]



> ''... පහන් වූ සැටි **කොයියාකාරද** කීවොත්....''[19]
> ''...අකම්පාල....''[20] (කම්පාව)

තවද,

> ''තපින්ඩ
> නලංගුවක්
> ජඹුර
> බහදෙනවා
> වැහුම් ඇරෙනවා
> නුරුස්සන්ඩත්
> නිම්මයක්'' [21] යනාදී වදන්ද මේ සඳහා නිදසුන් කළ හැකි ය.

මෙවැනි නිදර්ශන පිළිබඳ පුනරාවලෝකනය කරන කල මෙවැනි වදන් භාෂණ ව්‍යවහාරයෙහි පමණක් යොදන, ව්‍යක්ත ලේඛන කෙරෙහි අභාවිත වදන් බව කිවයුතු නොවේ.

### 2. වර්තමාන කතා ව්‍යාවහාරයේ අවිද්‍යමාන තත්කාලීන ව්‍යවහාරගත වචන

කතෝලික හා ක්‍රිස්තියානි ග්‍රන්ථකරුවෝ තම පරමාර්ථ සධනයෙහිලා හැකි සෑම පියවරක්ම යෙදීමට යත්න දැරූහ. ජනතාවට වඩාත් සමීප වීම මෙන්ම සිංහල ලේඛන ව්‍යවහාරය පිළිබඳ වූ අල්පාවබෝධ හේතුවෙන් ඔවුන් තත්කාලීන කටවහර ලේඛනය සඳහා භාවිත කර ඇත.

> ''...දුක්ගාවිනා....''[22]
> ''...අමන්දු නොවී....''[23]
> ''...වදපංගම්....''[24]
> ''...සුමන්දු වන්නේ මන්ද?''[25]

මෙවැනි නිදර්ශන මගින් යථෝක්ත ග්‍රන්ථකරුවන් තම පරමාර්ථ සාධනයෙහිලා කටවහර භාවිත කළ අයුරු පිළිබඳ ඒකදේශයක් පැහැදිලි වේ.

### 3. පද විකෘතිතා

කතෝලික හා ක්‍රිස්තියානි ආගමික ග්‍රන්ථ රචකයින් සිංහල භාෂාව පිළිබඳ මනා පරිචයකින් වියුක්ත වූවන් බව මුලින්ද දක්වන

ලදි. විශේෂයෙන් පාලි හා සංස්කෘත භාෂානුසාරයෙන් පෝෂිත සිංහල භාෂාවේ ලේඛන ව්‍යාවහාරයෙහි දී අක්ෂර වින්‍යාසය වෙසෙසින් වීමංසනයට ලක් වන්නකි. එහෙත්, සිංහල අක්ෂර වින්‍යාසය ශ්‍රවණානුසාරයෙන් උගත් උක්ත රචකයන් ස්වකීය කෘතීන්හි උච්චාරණය අනුව භාෂාව භාවිත කළෙන් ඒවායෙහි පද විකෘතිතා විද්‍යමාන වේ. විශේෂයෙන් කටවහර භාවිත කළ ආකාරය පිළිබඳ විමසීමේ දී මහාප්‍රාණ විෂයෙහි අල්පප්‍රාණ යෝජනය වැදගත් වේ. එයට හේතු වන්නේ සාමාන්‍ය කටවහරේ දී ලේඛන කාර්යෙහිලා මහාප්‍රාණ යෙදිය යුතු අවස්ථාවන්හි අල්පප්‍රාණ භාවිත කරන හෙයින් එම ලක්ෂණය මෙම ආගමික ග්‍රන්ථ රචකයින්ද අනුගමනය කරති බැවිනි. පහත දැක්වෙනුයේ එවන් අවස්ථා කීපයක් පමණි.

''ප්‍රතම''[26] (ප්‍රථම)
''වාසස්තාන''[27] (වාසස්ථාන)
''අකන්ඩ''[28] (අඛණ්ඩ)

තවද, භාෂණයේ දී 'ස' කාර භේදයද බලනොපාන්නකි. බයිබල් පරිවර්තන වැනි ග්‍රන්ථයන්හිද මූර්ධජ 'ෂ' සහ තාලුජ 'ශ' යුතු ස්ථානවල දන්තජ 'ස' කාරය යොදා ඇත.

''ගෝසා''[29] (ඝෝෂා)
''කීබස''[30] (කර්කශ)

මෙම නිදසුන්වල මූර්ධජ 'ෂ' හා තාලුජ 'ශ' භාවිත වියයුතු අවස්ථාවන්හි භාවිත වී ඇත්තේ දන්තජ 'ස' කාරයයි. එය කටවහරෙහි ලක්ෂණයකි. මෙවැනි අවස්ථාවන්හි අක්ෂර වින්‍යාසය සදොස් වීමෙහිලා බලපාන්නට ඇත්තේ ශ්‍රවණානුසාරයෙන් ග්‍රන්ථකරණයෙහි නියුතු වීමයි.

තවද, 'න' හා 'ල' පිළිබඳ විමසීමෙන්ද කතෝලික හා ක්‍රිස්තියානි ආගමික ග්‍රන්ථකරුවන් කටවහර භාවිත කළ අයුරු වටහා ගත හැකිය. මූර්ධජ 'ණ' හා 'ළ' යෙදිය යුතු පරිසරයන්හි දන්තජ 'න' හා 'ල' යෙදීම කටවහරට අනුව සාවද්‍ය නොවේ. ඇතැම් විට භාෂා ඥානයෙන් තොරවීම හෝ සමකාලීන ප්‍රවණතා හේතුවෙන් මෙසේ භාෂාව වහරන්නට ඇතැයි සිතිය හැකි ය.



සම්භාෂන (සම්භාෂණ)
දකුන/දක්ෂින (දකුණ/දක්ෂිණ)
කරුනාව (කරුණාව)
තරුනයා (තරුණයා)
සරන (සරණ)
මරනය (මරණය)
ලදරු (ළදරු), පොලව (පොළව)
පලල (පළල), ඉහල (ඉහළ)[31]

මෙම නිදසුන්වලින් ඉහත කරුණු සනාථ වේ.

තවද, කථිත බසෙහි වචන උච්චාරණය කරන ස්වරූපය අනුව ඇතැම් වචන ලියන්නට යාම නිසා අක්ෂර වින්‍යාසය අවුල් වූ අවස්ථාද දැකිය හැකි ය. කටවහර භාවිතයෙන් පද විකෘතිතාව ඇති වූ තවත් අවස්ථාවක් සේ එය දැක්විය හැකි ය.

''බවුතීස්ම''[32] (බෞතීස්ම)
''සේමභූමිය''[33] (ක්ෂේමභූමිය)
''ඉස්ත්‍රිය''[34] (ස්ත්‍රිය)
''මෞපියන්ඩ''[35] (මව්පියන්ට)

එමෙන්ම, කතෝලික හා ක්‍රිස්තියානි ආගමික ප්‍රචාරණය උදෙසා ග්‍රන්ථ රචනා කළ පිරිස් කටවහර යොදා ගැනීමේදී සම්මත ලේඛන ව්‍යවහාරය මතු නොව සම්මත භාෂණ ව්‍යවහාරයද අතික්‍රමණය කළ අතර, එනිසා පද විකෘතිතා ඇති වූ බව පෙනේ.

''දෙවිහාමිදොරුවො''[36] (දෙවිහාමුදුරුවො)
''මනආලයා''[37] (මනමාලයා)
''මිත්ත්‍යාද්‍රිෂ්ටිංගෙ''[38] (මිථ්‍යාදෘෂ්ටි)
''රස්ත්‍රිය''[39] (රාත්‍රිය)

මෙම රූප පරීක්ෂා කිරීමේ දී ඉහත කරුණ පැහැදිලි වේ. ''ආගමික ලේඛන හැරුණුවිට අදාළ යුගයෙන් ඉතිරි වී ඇති දැන්වීම් පත්‍රිකා සම්බන්ධව අධ්‍යයනයක යෙදෙන එස්.එල්. කැකුලාවල එහිලා උපයුක්ත භාෂා ව්‍යවහාරය කටවහරෙහි විශේෂ අවස්ථාවක් (super colloquial structure) ලෙස හඳුන්වයි.''[40] මෙම වචන වර්තමාන කටවහරේ හමුවන වචනවලින්ද අන්‍යවීම විශේෂත්වයකි.

### 4. උක්ත්‍යාඛ්‍යාත යෝජනය

කතෝලික හා ක්‍රිස්තියානි ග්‍රන්ථකරුවන්ගේ මූලික පරමාර්ථය වූ ආගම ප්‍රචාරණයෙහිලා කටවහර භාවිත කළ අයුරු විමසීමේදී ඒ සඳහා ව්‍යාකරණය සකසා ගත් අයුරු විමසීමද වැදගත් වේ. කථිත බසෙහි ව්‍යාකරණය ලිඛිත බසෙහි ව්‍යාකරණයට වඩා බෙහෙවින් සරලය; නිරාකුලය. උක්තය කවරාකාර වුවද ආඛ්‍යාතය එකම ස්වරූපයෙන් යෙදීම කථා ව්‍යවහාරයට ආවේණික ලක්ෂණයකි. මෙසේ කථිත බසෙහි ව්‍යාකරණය ලේඛනයට ගැනීමට බල පෑ හේතු පිළිබඳව බයිබල් පරිවර්තනයක් කළ සැමුයෙල් ලැම්බ්‍රික් (Samuel Lambrick) එහි ආරම්භයෙහි දක්වන පහත ප්‍රකාශවලින් පැහැදිලි වේ. ''මේ පොතම ගාම්භීර වාක්‍යයන් හා වාසගන්වලට පිටපත් කොට දැනට නුඹලා අතරෙහි පතලව තිබෙනුය. දෙවනුත්, එම පොතම කුමක් පිණිස සාදන ලද්දේදැයි මඳකින් දක්වමි. මේක උත්තම, අධම, පිඩිත, අපිඩිත සියල්ලන්ටම ඉතා වැදගත් කාරණාවක් බැවින් ප්‍රධානකොට ගම්භීර වාක්‍යයන්ගේ අර්ථ හඟවන්ට හැකි වූ ව්‍යවහාර වාක්‍යයන් එම ගාම්භීර වාක්‍යයන් වෙනුවට තැබුයෙමි.,. මෙකරුනු කරන කොටගෙන දෙවියන්ගේ ක්‍රියාවන් මනුශ්‍යයන්ට තේරුන් වෙන පිනිස මනුශ්‍යයන්ගේ ක්‍රියාවල් ප්‍රකාස කරන්නා වූ සැහැල්ළු වචනවලින්ම මේ පිටපත ප්‍රකාශ කළෙමි. එනම්, වදාල සේක වෙනුවට කීවාය. වැඩිසේක වෙනුවට ගියාය යනාදී වාක්‍යවල්ය''[41] මතුදැක්වෙන ඡේදයන්ගෙන් එය තවදුරටත් අවබෝධ කරගත හැකිය.

> ''එහෙත් තමාගේ සහෝදරයා තමා හෙදව පවුකොලේනම් ගොස් තවද උඹත් ඒ ඇයත් අතරේ තනිකර ඔහුට තරවටු කරපනනඃ උඹෙ වචනෙ ඔහු ඇහී නම් උඹෙ සහෝදරයාව උඹ දිනුවාය.''[42]
>
> ''ඔවුන්ද ඔහු සමග හැරී ගියාය.''[43]
>
> ''පටන් ගැන්මේදී දෙවියන් විසින් ස්වර්ගයත් පොලවත් මැව්වාය. පොලොව අරූපව හිස්ව තිබුනාය. ගැඹුරපිට අන්ධකාරය තිබුනාය. දෙවියන්වහන්සේ ස්ප්‍රීතුව වතුරපිට හැසුරුවාය. දෙවියෝ එලිය වේවයි කීවාය. එවිට එලිය වුනාය.''[44]
>
> ''...එවිට යෙහොවඃ තාගේ අතේ තිබෙන්නෙත් මොකදැයි ඇසුවාය. ඔහුද සැරමිටියයැයි කීවාය. ඒක බිම හෙලවයි කීවාය. ඔහු ඒක බිම හෙළුවාය. එවිට එහ්ක සර්පයෙක්වුනාය. මෝසෙස්ද ඌ ලඟින් දිව්වාය.''[45]



ඉහත දක්වන නිදර්ශනයන්ගෙන් අප ප්‍රස්තුතයට අදාළ ආගමික ග්‍රන්ථයන්හි කටවහරේ එන වියරණය ලේඛනමය ව්‍යාකරණය විෂයෙහි යෝජනයට දැරූ තැත පැහැදිලි වේ. එහි අංකිත උක්තාඛ්‍යාතපද විමසීමේදී පහත කරුණු සනාථ කරගත හැකිය.

1. උක්තය කුමක් වුවත් එකම අඛ්‍යාත ස්වරූපය යොදා තිබීම
2. උක්තය යෙදිය යුතු ස්ථානයේ අනුක්ත පද යොදා තිබීම
3. උක්ත කර්තෘ පද සමග කතා ව්‍යවහාරාගත ආඛ්‍යාත අන්තයෙහි 'ය' නිපාත යොදා තිබීම

මෙම නිදසුන් අනුව කතෝලික හා ක්‍රිස්තියානි ආගමික ග්‍රන්ථකරණයෙහි නියුතුවූවන් ස්වකීය පරමාධ්‍යාශය සාධනය කරනු වස් කටවහර භාවිතයේදී භාෂණ ව්‍යාකරණයේ උක්තාඛ්‍යාත නියමයන් ලේඛනය විෂයෙහි යෙදවීමට උත්සුක වූ අයුරු පැහැදිලි වේ.

### 5. ප්‍රත්‍යයයෝජනය

විවිධ ප්‍රත්‍යයන් යොදා ඇති ආකාරය පිළිබඳ විමසීමෙන්ද උක්ත සාහිත්‍යකරුවන් ලිඛිත ව්‍යවහාරය අභිභවා කථිත ව්‍යවහාරයම ඉස්මතු කිරීමට සෑම විටම පාහේ උත්සාහ දැරූ බව පැහැදිලි වෙයි.

> ''අනියමාර්ථ වාචී පුරුෂලිංග කර්ම විභක්ති ඒක වචනයෙහි 'අකු' ප්‍රත්‍යයට වඩා 'එකු' ප්‍රත්‍යයත්, අනියමාර්ථ වාචී ස්ත්‍රී ලිංග කර්ම විභක්ති ඒක වචනයෙහි 'අක' ප්‍රත්‍යයට වඩා 'අකු-එකු-අක්-එක්' ප්‍රත්‍යයත් අනියමාර්ථ වාචී නපුංසක ලිංග ප්‍රථමා විභක්ති ඒක වචනයෙහි 'එක්' ප්‍රත්‍යයට වඩා 'අක්' ප්‍රත්‍යයත් මෙහි බහුලව යොදාගෙන ඇත''[46]

යනුවෙන් අනියමාර්ථ ප්‍රත්‍යය යෝජනය පිළිබඳ මෙම කෘතීන්හි විද්‍යමාන කටවහරෙහි බලපෑම ආරිය රාජකරුණා දක්වයි. මතු දැක්වෙනුයේ ස්ත්‍රී ලිංගාර්ථයෙහි යෙදුණු එවැනි රූප කිහිපයකි.

''...ගොයියෙක්....''[47] (ගොවියෙක්)
''ස්ත්‍රියෙක්, ස්ත්‍රියෙකු, මවෙක්''[48]
''...ඇවිරිද්දක්....''[49] (අවුරුද්දක්)

තවද, කිතුවසින් දස වන සියවසේ පමණ අචේතනික නාම පදයන්ගෙන් පරව බහුවචනාර්ථයේ යෙදුණු 'වල්' ප්‍රත්‍යය අවිශේෂයෙන් යෙදීම හා එය ද්විත්වව යෙදීමද මෙම ග්‍රන්ථයන්හි දැකිය හැකිය.

''...වචනවල් ...''[50]
''...ඉගැන්වීම්වල්....''[51]
''...භාජනවල්....''[52]
''... පුදුමවල්....''[53]
''නුවරවල්වල...'' [54]

මෙවැනි නිදර්ශනවලින් පැහැදිලි වනුයේ කටවහරම ලේඛනමය භාෂාව වශයෙන්ද යොදා ගැනීමෙහිලා අප කර්තෘන් අවධානය යොමු කළ බවයි.

## සමාලෝචනය

ක්‍රි. පූ. යුගයේ පටන් සාමාජික, සංස්කෘතික, අධ්‍යාපනික ආදි සකලවිධ අංශයන්හි පදනම සැකසූයේ බුදුසමයයි. සාහිත්‍ය ක්ෂේත්‍රය හුදෙක් බෞද්ධ සාහිත්‍යයක්ම විය. සාහිත්‍යය හා බුදුදහම අතර වූ අවියෝජනීය සබඳතාව බණ්ඩනය කරමින් දහසය වන සියවසයේ සිට සිංහල සාහිත්‍ය විෂයයෙහි නව ආගමික, දාර්ශනික අදහස් සමගින් කතෝලික හා ක්‍රිස්තියානි ග්‍රන්ථ බිහිවන්නට විය. ආගම ප්‍රචාරණය මුඛ්‍ය පරමාර්ථය කොටගත් එම ග්‍රන්ථයන් මගින් සාම්ප්‍රදායික බෞද්ධ සාහිත්‍යයට යොමු වූවන් එයින් මුදවා, නව්‍ය වූ ආගම වෙත ආකර්ෂණය කර ගැනීමට එම ග්‍රන්ථකරුවෝ යත්න දැරූහ. එහෙයින් සිංහල සාහිත්‍යයට එතෙක් අවිෂය වූ සාහිත්‍යයක් බිහි විය. කතෝලික හා ක්‍රිස්තියානි සාහිත්‍යය බිහි වූයේ එසේය. දහසය වන සියවසේ පමණ සිට දහනව වන විසි වන සියවස පමණ වන තුරු භාෂාශාස්ත්‍රයන්හි පරිහානියක් පෙන්වයි. එ සමයෙහි උගත්හු විරල වූහ. ග්‍රන්ථකරණය සීමාසහිත විය. කථික හා ලිඛිත ව්‍යවහාරය අතර වූ පරතරය අඩු විය. මෙවැනි හේතූන් හා කතෝලික හා ක්‍රිස්තියානි ග්‍රන්ථකරුවනට සිංහල භාෂාව පිළිබඳ වූ අත්‍යල්පාවබෝධයත් හේතුවෙන් ලේඛනය සඳහා ද කටවහරම භාවිත කරන්නට සිදු විය. ඇතැම් විට එය ජනතාවට වඩාත් සමීප



වීමෙහි කඩිනම් මාර්ගයක් සේ ඔවුන් සලකන්නට ද ඇත. ඒ අනුව මෙම ලිපියෙන් සාකච්ඡා කරනු ලැබුයේ කතෝලික හා ක්‍රිස්තියානි ආගමික ග්‍රන්ථකරුවන් තම ආගම ප්‍රචාරණය සඳහා උපයුක්ත කටවහර පිළිබඳවය. එහිදී කටවහරේ පමණක් හමුවන වචන භාවිතය, වර්තමාන කථාව්‍යවහාරයේ අවිද්‍යමාන තත්කාලීන ව්‍යවහාරගත වචන භාවිතය, පද විකෘතිතා, උක්ත්‍යාඛ්‍යාත යෝජනය, ප්‍රත්‍යයයෝජනය යන ශීර්ෂයන් යටතේ ඒ පිළිබඳ කරුණු සාකච්ඡා කළෙමු. එම කරුණු අනුව ආගම ප්‍රචාරණයෙහිලා කතෝලික හා ක්‍රිස්තියානි ආගමික ග්‍රන්ථකරුවන් කටවහර භාවිතයට ගත් ආකාරය පිළිබඳ සනිදර්ශනව සාකච්ඡා කෙරිණි.

**ආන්තික සටහන්:**


1 සුරවීර ඒ.වී., සමාජීය සාහිත්‍ය අධ්‍යයනය, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 1982, 3-4 පිටු.

2 සියබස්ලකර දීපනී, සංස්: ගුණවර්ධන, වී.ඩී.එස්., කොළඹ: සමයවර්ධන සමාගම, 2003, 20 පද්‍යය.

3 අරංගල, රත්නසිරි, නූතන සිංහල සාහිත්‍යයේ ප්‍රභවය, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2004, 143 පිටුව.

4 එඩ්මන්ඩ් පීරිස්, 'කතෝලික සිංහල සාහිත්‍යය', සිංහල විශ්වකෝෂය, සවන කාණ්ඩය, සංස්: හෙට්ටිආරච්චි, ඩී.ඊ., කොළඹ: රජයේ මුද්‍රණාලය, 1978, 133 පිටුව.

5 -එම-, 134 පිටුව.

6 අයේෂා, මාරි පැවිදි සොයුරිය, හෙළ පද්‍ය සාහිත්‍යයෙහි කිතුනු පැවිදි කවීන්, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2004, 41-42 පිටු.

7 Perera, S.G., Life of Father Jacome Goncalvez, Madura: De Nobili Press, 1942, Pp. 118-150

8 අරංගල, රත්නසිරි, නූතන සිංහල සාහිත්‍යයේ ප්‍රභවය, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2004, 144 පිටුව.

9 -එම-, 148-149 පිටු.

10 -එම-, 150 පිටුව.

11 පීරිස්, එඩ්මන්ඩ්, සිංහල ක්‍රිස්තියානි සාහිත්‍ය වංශය, කොළඹ: එක්සත් ක්‍රිස්තියානි පොත් සමාගම, 1961, 06 පිටුව.

12 -එම-, 11 පිටුව.

13 කරුණාරත්න, රසික, දහනමවන සියවසේ සිංහල ගද්‍ය රීතිය, නුගේගොඩ: කර්තෘ ප්‍රකාශනයකි, 2003, 26-28 පිටු.

14 අරංගල, රත්නසිරි, නූතන සිංහල සාහිත්‍යයේ ප්‍රභවය, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2004, 158 පිටුව.

15 රාජකරුණා ආරිය, දහනමවන සියවසේ සිංහල ගද්‍ය සාහිත්‍යය, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1994, 181 පිටුව.
16 ආරියරත්න, සුනිල්, ජාකෝමේ ගොන්සාල්වේස් තෝරාගත් කෘති, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2003, 228 පිටුව.
17 -එම-
18 -එම-, 229 පිටුව.
19 -එම-, 243 පිටුව.
20 -එම-, 246 පිටුව.
21 අරංගල, රත්නසිරි, නූතන සිංහල සාහිත්‍යයේ ප්‍රභවය, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2004, 165-166 පිටු.
22 -එම-, 227 පිටුව.
23 ආරියරත්න, සුනිල්, ජාකෝමේ ගොන්සාල්වේස් තෝරාගත් කෘති, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2003, 249 පිටුව.
24 -එම-, 251 පිටුව.
25 ආරියරත්න, සුනිල්, ජාකෝමේ ගොන්සාල්වේස් තෝරාගත් කෘති, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2003, 255 පිටුව.
26 බයිබලය, නව ගිවිසුම (New Testement), කොළඹ: මිෂනාරි මුද්‍රණාලය (Mission Press), 1813, 99 පිටුව.
27 -එම-, 121 පිටුව.
28 -එම-, 1013 පිටුව.
29 -එම-, 51 පිටුව.
30 සුද්ද වූ බයිබලය, මිසියොනාරිස් පරිවර්තනය(වෙරිවිමිසියොනාරිස් සමාගම), කොට්ටේ: චර්ච් මිෂනාරි මුද්‍රණාලය, 1846, 65 පිටුව.
31 කරුණාරත්නන, රසික, දහනමවන සියවසේ සිංහල ගද්‍ය රීතිය, නුගේගොඩ: කර්තෘ ප්‍රකාශනයකි, 2003 59-73 පිටු.
32 බයිබලය, නව ගිවිසුම (New Testement), කොළඹ: මිෂනාරි මුද්‍රණාලය (Mission Press), 1813, 08 පිටුව.
33 -එම-, 22 පිටුව.
34 -එම-, 69 පිටුව.
35 -එම-, 42 පිටුව.
36 -එම-, 11 පිටුව.
37 -එම-, 36 පිටුව.
38 -එම-, 40 පිටුව.
39 -එම-, 115 පිටුව.
40 අරංගල, රත්නසිරි, නූතන සිංහල සාහිත්‍යයේ ප්‍රභවය, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2004, 164 පිටුව.
41 සඳගෝමී කෝපරහේවා, 'බයිබලය හා සිංහල බස් වහර', සිළුමිණ (පුන්කලස අතිරේකය), 2006.12.24, සසස පිටුව.
42 බයිබලය, නව ගිවිසුම (New Testement), කොළඹ: මිෂනාරි මුද්‍රණාලය (Mission Press), 1813, 82 පිටුව.



43 සුද්ද වූ බයිබලය, මිසියොනාරිස් පරිවර්තනය (වෙරිවිමිසියොනාරිස් සමාගම), කොට්ටේ: චර්ච් මිෂනාරි මුද්‍රණාලය, 1846, 18 පිටුව.
44 -එම-, 01 පිටුව.
45 -එම-, 65 පිටුව.
46 රාජකරුණා, ආරිය, 19 වන සියවසේ සිංහල ගද්‍ය සාහිත්‍යය, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1994, 177 පිටුව.
47 බයිබලය, නව ගිවිසුම (New Testement), කොළඹ: මිෂනාරි මුද්‍රණාලය (Mission Press), 1813, 56 පිටුව.
48 කරුණාරත්න, රසික, දහනම වන සියවසේ සිංහල ගද්‍ය රීතිය, කර්තෘ ප්‍රකාශන, 2003, 76 පිටුව.
49 බයිබලය, නව ගිවිසුම (New Testement), කොළඹ: මිෂනාරි මුද්‍රණාලය (Mission Press), 1813, 37 පිටුව.
50 -එම-, 115 පිටුව.
51 බයිබලය, නව ගිවිසුම (New Testement), (විලියම් ටොල්ෆ්‍රි පරිවර්තනය), කොළඹ: උපකාරී බයිබල් සමාගම, 1817, 119 පිටුව.
52 -එම-, 467 පිටුව.
53 සුද්ද වූ බයිබලය, මිසියොනාරිස් පරිවර්තනය (වෙරිවිමිසියොනාරිස් සමාගම), කොට්ටේ: චර්ච් මිෂනාරි මුද්‍රණාලය, 1846, 73 පිටුව.
54 කරුණාරත්න, රසික, දහනම වන සියවසේ සිංහල ගද්‍ය රීතිය, කර්තෘ ප්‍රකාශන, 2003, 76 පිටුව.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය:


අරංගල, රත්නසිරි, **නූතන සිංහල සාහිත්‍යයේ ප්‍රභවය**, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2004.

අයේෂා, මාරි පැවිදි සොයුරිය, **හෙළ පද්‍ය සාහිත්‍යයෙහි කිතුනු පැවිදි කවීන්**, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2004.

ආරියරත්න, සුනිල්, **ජාකෝමේ ගොන්සාල්වේස් තෝරාගත් කෘති**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2003.

කරුණාරත්න, රසික, **දහනම වන සියවසේ සිංහල ගද්‍ය රීතිය**, කර්තෘ ප්‍රකාශන, 2003.

කාරියවසම්, තිස්ස, **ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාව (1737-1976)**, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2004.

පඤ්ඤාසේකර හිමි, කලුකොඳයාවේ, **සිංහල පුවත්පත් සඟරා ඉතිහාසය**, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1996.

පීරිස්, එඩ්මන්ඩ්, **සිංහල ක්‍රිස්තියානි සාහිත්‍ය වංශය**, කොළඹ: එක්සත් ක්‍රිස්තියානි පොත් සමාගම, 1961.

රාජකරුණා, ආරිය, **19 වන සියවසේ සිංහල ගද්‍ය සාහිත්‍යය,** කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ, 1994.

සරච්චන්ද්‍ර, එදිරිවීර, **සිංහල නවකතා ඉතිහාසය හා විචාරය,** මහරගම: සමන් මුද්‍රණාලය. 1964.

සුරවීර, ඒ.වී., **සමාජීය සාහිත්‍ය අධ්‍යයනය,** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1982.

**බයිබලය, නව ගිවිසුම** (New Testement), කොළඹ: මිෂනාරි මුද්‍රණාලය (Mission Press), 1813.

**බයිබලය, නව ගිවිසුම** (New Testement), (විලියම් ටොල්ෆ්‍රි පරිවර්තනය), කොළඹ: උපකාරී බයිබල් සමාගම, 1817.

**ශුද්ධ බයිබලය (පරණ සහ අලුත් ගිවිසුම),** කොළඹ: කොළඹ බයිබල් සමාගම, 1952.

**සියබස්ලකර දීපනී,** සංස්: ගුණවර්ධන වී.ඩී.එස්., කොළඹ: සමයවර්ධන පොත්හල, 2003.

**සුද්ධ වූ බයිබලය,** මිසියොනාරිස් පරිවර්තනය(වෙස්ලියන්මිසියොනාරිස් සමාගම), කොට්ටේ: චර්ච් මිෂනාරි මුද්‍රණාලය, 1846.

Perera, S.G., **Life of Father Hacome goncalvez**, Madura: De Nobili Press, 1942.

සඟරා හා පුවත්පත්:

**ක්‍රිස්තියානි විමුක්ති මාර්ගය (බයිබල් පාඨ සංග්‍රහය),** ශ්‍රී ලංකා බයිබල් සමාගම හා ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය, 1978.

**චින්තක - ශාස්ත්‍රීය සංග්‍රහය,** සංස්: සෝරත හිමි, මොරවක, නන්ද හිමි, අබ්ඩියාගල, කැලණිය: විශ්වවිද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමය, 1994.

**පුවත්පත් සමීක්ෂණ-1** සංස්: පෙරේරා, කේ. ඇස්., ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රකාශනයකි. 1993. **පුවත්පත් සමීක්ෂණ-2,** සංස්: පෙරේරා, කේ. ඇස්., ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රකාශනයකි. 1993.

**සිළුමිණ,** 2006 දෙසැම්බර් 12.

විශ්වකෝෂ:

**සිංහල විශ්වකෝෂය, සයවන කාණ්ඩය,** සංස්: හෙට්ටිආරච්චි, ඩී. ඊ., කොළඹ: රජයේ මුද්‍රණාලය, 1978.

**සිංහල විශ්වකෝෂය, සත්වන කාණ්ඩය,** සංස්: ධර්මදාස, කේ. එන්. ඕ., කොළඹ: රජයේ මුද්‍රණාලය, 1994.

# ලාංකේය සාම්ප්‍රදායික අවාචික සන්නිවේදන රටාවල වෙසෙසියාව

**ස්වර්ණා ඉහළගම**

Comunication, one of the basic needs of human existence, can be defined as the tranfer or exchange of information between individuals. It is a powerful tool to spend the social life for the human who is a social animal by nature. In ancient times there were no communication systems like in modern societies but they have been used many traditional communication methods both verbal and non-verbal to fulfill their communication needs effectively. Apart from verbal communication, non-verbal communication is so powerful that the message sent can sometimes outweigh verbal language. as silence can be louder than words now. In the context of Sri Lanka, many traditional non-verbal communication methods can be identified folklore. This study aims to identify such methods that have been used by ancient people to fulfill their communication needs. The methodology used is a literature survey. Acoording to the findings, it can be concluded that the non-verbal communication methods in ancient times in Sri Lanka have been more beneficial in various communication activities that lead to good governance of the community, protecting cultural values and norms, customs and manners, environmental conservation, early warnings on diseases and disasters etc. In addition, some non-verbal communication methods are practised by perople in some rural areas.

ස්වභාවයෙන් ම සමාජයීය සත්ත්වයකු වන මිනිසාට සමාජ ජීවිතය ගත කිරීම සඳහා ප්‍රබලතම ආධාරකය වන්නේ සන්නිවේදනය යි. සන්නිවේදනය යනු අදහස්, හැඟීම්, ආකල්ප, තොරතුරු ආදිය

---

© **ආචාර්ය ස්වර්ණා ඉහළගම**

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 23 කලාපය, 2014/2015**

මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය